# 25 මල් උයනේ යාච්ඤාව



25.1 රූපය - ජේසුස් වහන්සේ ගෙත්සෙමනෙ (මල්) උයනේ යාච්ඤා කිරීම

ඇග්නස් - ආනේ තෙරේසා! හරි ලස්සන පින්තූරයක්. මොකට ද මේක ගෙනාවේ?

තෙරේසා - අද අපේ පාඩම මල් උයනේ යාච්ඤාව නේ, ඒ නිසයි මේක ගෙනාවේ. ජේසු එදා මල් උයනේ යාච්ඤා කළ ආකාරයයි මේ පින්තූරයෙන් දැක්වෙන්නේ.

ඇග්නස් - එතකොට ජේසු තනියම ද මල් උයනේ යාච්ඤා කරන්නට ගියේ?

තෙරේසා - අපෝ නෑ, එදා ඔවුන් වහන්සේ අපෝස්තුලුවරුන් කැඳවාගෙන තමයි ගෙත්සෙමනෙ උයනට යාච්ඤා කරන්නට වැඩියේ. අපෝස්තුලුවරුන් අතරින් පේදුරු තුමා, ජාකොබ් තුමා හා ජුවාම් තුමා අනිත් අයට වඩා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට ආසන්නයේ සිට යාච්ඤා කරන්නට ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ උපදෙස් දුන්නා. ඒත් ඒ අය කළේ හොඳට නිදි ගත්ත එක.

ඇග්නස් - අනේ ඇත්ත ද? මමත් ගොඩාක් දවස්වලට යාච්ඤා කරන්නේ නැති ව කම්මැලිකමට නිදා ගන්නවා, ඔයාත් එහෙම ද?

තෙරේසා - මම නම් හැමදාම කොන්තෙ අරගෙන ජපමාලය කියලා තමයි නිදා ගන්න යන්නේ. එදා ජේසුස් වහන්සේ මල් උයනේ දී තුන් වරක් යාච්ඤා කරන්නට කියලා ශ්‍රාවකයන් තුන් දෙනාට උපදෙස් දුන්නත් එම අවස්ථා තුනේ දී ම ඔවුන් යාච්ඤා නොකර නිදා ගත්තා.

ඇග්නස් - මමත් ඔයා වගේ අද ඉඳලා හැමදාම කොන්තේ කියන්න උත්සාහ කරනවා.

තෙරේසා - මතකද ඔයාට අපේ ආගම ටීචර් කිව්වා, සැම අවස්ථාවක දී ම අතපසු නොකොට යාච්ඤාවේ නිරත වීම දේව දරුවෙකුගේ ලක්ෂණයක් කියලා.

ඇග්නස් - අන්න ටීචර් එනවා පන්තියට....... අපි ටීචර්ගෙන් මල් උයනේ යාච්ඤාව ගැන තව දුරටත් ඉගෙන ගනිමු.

මල් උයනේ යාච්ඤාව (මාක් 14:32-42) මගින් අපට ඉදිරිපත් කරන ප්‍රබල පණිවිඩය වන්නේ, ජීවිතයේ සැම වැදගත් අවස්ථාවකට ම යාච්ඤාවෙන් සූදානම් විය යුතු බව ය. මල් උයන කියන්නේ, ගෙත්සෙමනෙට ය. එය ජෙරුසලම් නගරයට මුහුණලා ඔලීව කන්දෙහි බටහිර බෑවුමෙහි පිහිටා තිබිණි. ජේසුස් වහන්සේ උත්තම පූජක යාච්ඤාවෙන් පසු (ජොහන් 18:1) ශ්‍රාවකයන් සමඟ ගෙත්සෙමනෙ නම් වූ තැනට පැමිණ, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ශ්‍රාවකයන් අමතා මෙසේ වදාළ සේක:

"මා යාච්ඤා කරන අතර, ඔබ මෙහි සිටින්න"
(මාක් 14:32)

"මැරෙන තරමට මාගේ සිත අතිශයින් ශෝකාකුල ය; මෙහි නැවතී අවදි ව සිටින්න"
(මාක් 14:34)

ඔවුන් වහන්සේ මදක් පෙරට ගොස් මුණින් තලා වී දෙවි පියාණන් වහන්සේට මෙසේ යාච්ඤා කළ සේක:

"අබ්බා, පියාණෙනි, ඔබට සියල්ලක් ම හැකි ය; මේ කුසලාන මා කෙරෙන් ඉවත් කළ මැනව; එහෙත් මාගේ කැමැත්ත නොව, ඔබගේ කැමැත්ත වේවා"
(මාක් 14:36)

මල් උයනේ යාච්ඤාවෙන් පෙන්නුම් කරන කරුණු 3කි.

1. ජේසුස් වහන්සේගේ සැබෑ මනුෂ්‍යත්වය
2. දෙවියන් වහන්සේ හා ක්‍රිස්තුන් වහන්සේ අතර ඇති සබැඳියාව
3. ඔවුන් වහන්සේගේ දුක්ප්‍රාප්තිය

ජේසුස් වහන්සේ මල් උයනේ යාච්ඤාව තුළින් දේව සැලසුම ක්‍රියාත්මක කිරීමටත් ඒ සඳහා මුහුණ දීමටත් අවශ්‍ය ශක්තිය ලබා ගත් සේක. එහෙත් අපෝස්තුලුවරුන් යාච්ඤාවෙන් ශක්තිය ලබා නොගත් නිසා පරීක්ෂාවට වැටුණි. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ව අත්අඩංගුවට ගැනීමට පැමිණි අවස්ථාවේ දී;

- ඔවුන් වහන්සේ ව අතහැර පලායාම
- උත්තම පූජකවරයාගේ දාසයා වූ මල්කුස්ගේ කණ කපාලීම
- පේදුරු තුමා තෙවරක් ඔවුන් වහන්සේ ව නාඳුනන බව ප්‍රකාශ කිරීම

නිදර්ශන ලෙස දැක්විය හැකි ය.

ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්ති විස්තරයෙහි ඇති වැදගත් ස්ථානයක් ගෙත්සෙමෙනි අත්දැකීමට හිමි වේ.

දෙමාපියන් සමඟ දරුවන් කතා කරන්නා සේ, දෙවියන් වහන්සේගේ දරුවන් ලෙස අපට දෙවියන් වහන්සේ සමඟ කතා කළ හැකි ය. දේව පුත්‍රයාණන් වූ ක්‍රිස්තුන් වහන්සේ හැකි සෑම අවස්ථාවක දී ම පියාණන් වහන්සේට යාච්ඤා කළ සේක. යාච්ඤාව කිතුනු ජීවිතයේ අනිවාර්යය අංගයක් විය යුතු ය. කිතුනු ජීවිතය රඳා පවතින්නේ යාච්ඤාව මත ය. යාච්ඤාව සඳහා ම සුදුසු පරිසරයක් සහිත ස්ථානයක් තමන්ගේ නිවසේ, කාමරයේ සකස් කර ගන්නේ නම් අපගේ යාච්ඤාවේ ජීවිතයට එය හොඳ උදව්වක් වේවි.



25.1 රූපය - යාච්ඤා කිරීම

→ යාච්ඤාව මගේ ජීවිත පැවත්මේ දෛනික කාර්යයක්, පුරුද්දක් බවට පත්කර ගනිමි.

→ පවුලක් ලෙස එකට එකතු වී ජපමාලය දිනපතා උච්චාරණය කරමි.

→ ශුද්ධ වූ පැය හා යාච්ඤා මෙහෙයන් තුළ නිරත වීමෙන් මාගේ ආධ්‍යාත්මික ජීවිතය වර්ධනය කර ගනිමි.

→ සෑම දිනක ම නියමිත වේලාවකට යාච්ඤා කිරීමට පුරුදු වෙමි.

## ක්‍රියාකාරකම

1. "යාච්ඤාවෙන් සවිය ලබා දුර්පරීක්ෂාවෙන් ජය ගනිමු" යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.
2. මල් උයනේ යාච්ඤාවේ අන්තර්ගත කරුණු තුන කවරේ ද?
3. මාක් 14:36 පාඨය දෙවරක් හොඳින් කියවා මෙනෙහි කරන්න. ඒ අනුව ඔබට අයිති වූ දේව පණිවිඩය ලියා දක්වන්න.
4. දුර්පරීක්ෂාවලින් ජය ගැනීමට අවශ්‍ය ශක්තිය ඉල්ලා කිව හැකි යාච්ඤාවක් නිර්මාණය කරන්න.

*ජීවිතය සඳහා*

*දුර්පරීක්ෂාවෙන් ජයගැනීමට දිනපතා පවුලක් ලෙස එකට යාච්ඤා කරන්න*

23.1, 23.2, 23.3, 23.4, 23.5, 25.1 යන රූප සටහන් හැර අනිකුත් රූප සටහන් අන්තර්ජාලය ඇසුරින් ලබා ගන්නා ලදි.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.